00001

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
කළමනාකරණ අධ්‍යයන පීඨය
කළමනාකරණ අධ්‍යයන (ගෞරව) උපාධි පාඨමාලාව
තුන් (03) වන මට්ටම
AFU3506 - මූල්‍ය හා පිරිවැය ගිණුම්කරණය
අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය - 2023
කාලය : පැය දෙකයි (02)

දිනය 27.08.2023 | මුළු ලකුණු 100 | කාලය පෙ.ව. 09.30 සිට පෙ.ව. 11.30 දක්වා

විභාග අංකය [ ]

ඒ (A) කොටසේ සහ බී (B) කොටසේ සියළුම ප්‍රශ්නවලට ප්‍රශ්න පත්‍රය තුළම පිළිතුරු සපයන්න. වැඩසටහන් සම්පාදනය කළ නොහැකි ගණක යන්ත්‍ර භාවිතා කළ හැක.

අයදුම්කරු විසින් විභාගය අවසානයේ පිළිතුරු පත්‍රය විභාග පරීක්ෂකවරයා අතට පත්කළ යුතුය. එසේ නොවන හොත් අයදුම්කරුගේ පිළිතුරු පත්‍රය ලකුණු කිරීමක් සිදුනොවනු ඇත.

ඒ (A) කොටස
(බහුවරණ ප්‍රශ්න පත්‍රය)
නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1 සිට 20 දක්වා සෑම ප්‍රශ්නයකටම ලකුණු 04 බැගින් හිමිවේ.

1. ගිණුම්කරණයේ මූලික අරමුණ වන්නේ පහත සඳහන් දෑ වලින් කවරක්ද?
   i. සියලුම ගණුදෙනු ගිණුම් පොත් වල වාර්ථා කිරීම.
   ii. මූල්‍ය ගණුදෙනු වාර්ථාගත කිරීම, වර්ගීකරණය කිරීම, සාරාංශගත කිරීම යනාදියයි.
   iii. තීරණ ගන්නා පාර්ශවයන්ට තොරතුරු ලබා දීම.
   iv. කළමණාකරුවන් වෙත විස්තරාත්මක පිරිවැය තොරතුරු ලබාදීම.

2. නිවැරදි ගිණුම්කරණ සමීකරණය තෝරන්න.
   i. වත්කම් + වගකීම් = හිමිකම්
   ii. හිමිකම් = වත්කම් + ලාභය
   iii. හිමිකම් +වගකීම් = වත්කම්
   iv. හිමිකම් + වත්කම් = වගකීම්

3. 'සාධාරණ වෙළඳාම' නැමැති ව්‍යාපාරයේ අයිතිකරුගේ නමට රු. මිලියන 2.5ක් වටිනා පෞද්ගලික නිවසක් හිමි අතර එහි වෙළඳ අගය මිලියන 3ක් ලෙස තක්සේරු කොට තිබේ. කෙසේ උවද ඔහුගේ ව්‍යාපාරයේ ගිණුම් පිළියෙල කරන අවස්ථාවේදී එම දේපල වල වටිනාකම් ව්‍යාපාරයේ ගිණුම් වලට ඇතුළත් කර නොතිබුණි. මෙහිදී කවර ගිණුම්කරණ සංකල්පයක් අනුගමනය කොට තිබේද?
   i. පිරිවැය සංකල්පය
   ii. ප්‍රත්‍යාගණන සංකල්පය
   iii. උපලබ්ධි සංකල්පය
   iv. ව්‍යාපාර ඒකක සංකල්පය

4. ණය ගැතියන්ගෙන් මුදල් අයකරගත් පසු පහත ගිණුම්කරණ අයිතමයන්ට සිදුවන බලපෑම නිවැරදිව දක්වා ඇත්තේ පහත දැක්වෙන ප්‍රකාශ වලින් කුමන ප්‍රකාශයේද?
   i. වත්කම් ඉහලයාම සහ වගකීම් ඉහලයාම.
   ii. වත්කම් පහලයාම සහ වගකීම් පහලයාම.
   iii. වත්කම් පහලයාම සහ හිමිකම් පහලයාම.
   iv. වත්කම් වල අගයේ වෙනසක් සිදුනොවේ.

5. පහත සඳහන් අයිතමයන්ගෙන් කවර සංයෝජනයක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සඳහන් වන්නේද?
   i. වත්කම්, හිමිකම් සහ ආදායම්.   ii. වත්කම්, වගකීම් සහ වියදම්
   iii. වත්කම්, වගකීම් සහ ආදායම්   iv. වත්කම්, හිමිකම් සහ වගකීම්

6. ව්‍යාපාරයක වත්කම්, ස්ථාවර වත්කම් සහ ජංගම වත්කම් ලෙස වර්ග කිරීමට සහාය ලබා දෙන ගිණුම්කරණ සංකල්පය කුමක්ද?
   i. උපචිත සංකල්පය   ii. අඛණ්ඩ පැවැත්ම සංකල්පය
   iii. ගිණුම්කරණ කාලච්ඡේද සංකල්පය   iv. පිරිවැය සංකල්පය

7. පොදු ජ'නලය තුල වාර්තා නොකරන්නේ පහත සඳහන් ඳැ වලින් කවරක්ද?
   i. වැරදි නිවැරදි කිරීම.
   ii. වර්ෂ අවසාන ගැලපුම්.
   iii. ආරම්භක ශේෂයන් වාර්ථාකිරීම.
   iv. ණයට භාණ්ඩ විකිණීම.

8. පහත සඳහන් තොරතුරු XYZ වෙළඳ ව්‍යාපාරයේ ගිණුම් පොත් වලින් උපුටා ගන්නා ලදි.

| විස්තරය | වටිනාකම (රු) |
|---|---:|
| 2022 අප්‍රේල් 01 දිනට ශුද්ධ වත්කම් | 150,000 |
| අමතර ප්‍රාග්ධනය යෙදවීම | 25,000 |
| 2023 මාර්තු 31 වන දිනට ශුද්ධ වත්කම් | 135,000 |
| අයිතිකරු විසින් කරන ලද ගැනිලි | 12,000 |

2023 මාර්තු 31 වන දිනෙන් අවසන් වර්ෂය තුළ ශුද්ධ ලාභය/(අලාභය) ගණනය කරන්න.
   i. (රු.22,000/-)   ii. රු.28,000/-
   iii. (රු.52,000/-)   iv. (රු.28,000/-)

9. පහත සඳහන් තොරතුරු ABC තනි පුද්ගල ව්‍යාපාරයේ ගිණුම් පොත් වලින් උපුටා ගන්නා ලදි.

| විස්තරය | වටිනාකම (රු) |
|---|---:|
| 2022 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධනය | 200,000 |
| අයිතිකරු විසින් වර්ෂය තුල කරන ලද ගැනිලි | 120,000 |
| 2023 මාර්තු 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභය | 145,000 |
| 2023 මාර්තු 31 වන දිනට වගකීම් | 80,000 |

ඉහත තොරතුරු භාවිතයෙන් 2023 මාර්තු 31 වන දිනට මුළු වත්කම් වල වටිනාකම ගණනය කරන්න.
   i. රු.305,000/-   ii. රු.545,000/-
   iii. රු.345,000/-   iv. රු.225,000/-

10. පහත සඳහන් අයිතම වලින් ප්‍රාග්ධන වියදමක් වන්නේ කවරක්ද?
   i. රක්ෂණ වාරිකය ගෙවීම.
   ii. මාසික කුලී ගෙවීම.
   iii. ද්‍රූන් වට්ටම්.
   iv. ආනයනික යන්ත්‍ර මත බදු

11. ව්‍යාපරයක ආරම්භක තොගයේ වටිනාකම රු.25,000කින් අඩුවෙන් ගණනය කොට ඇති අතර අවසාන තොගයේ වටිනාකම් රු.30,000කින් අධි තක්සේරු කොට තිබේ. එහි බලපෑම වන්නේ,
   i. ලාභය රු.55,000/- කින් අධි තක්සේරු වෙයි
   ii. ලාභය රු.55,000/- කින් අවතක්සේරු වෙයි
   iii. ලාභය රු.5,000/- කින් අධි තක්සේරු වෙයි
   iv. ලාභය රු.5,000/- කින් අවතක්සේරු වෙයි

12. පහත සඳහන් කවර ප්‍රකාශනයක් නිවැරදි වන්නේද?
   i. වත්කම් විකුණුමක් විකුණුම් මූලික පොතේ වර්ථාගත කරයි.
   ii. ගැනුම් ආපසු යැවුම් ජ'නලයේ එකතුව ගැනුම් ආපසු යැවුම් ගිණුමට හරකරයි.
   iii. මුදල් පොත මූලික පොතක් ලෙස සහ ලෙජර ගිණුමක් ලෙසද සලකයි.
   iv. ගැනුම් ජ'නලය සියළුම ගැනුම් වර්ථාකරයි.

13. භාණ්ඩ ණයට මිලදී ගැනීමකින් පහත දැක්වෙන කවර බලපෑමක් ඇතිවේද?
   i. වගකීම් ඉහලයාම.
   ii. වත්කම් ඉහල යාම.
   iii. වත්කම් සහ වගකීම් යන දෙකම ඉහල යාම.
   iv. වත්කම් පහල යාම.

14. පහත දක්වා ඇති ගිණුම්කරණ අනුපාතයන්ගෙන් මූල්‍ය ස්ථාවරත්වය සහ ද්‍රවශීලතාවය ගණනය කළහැකි අනුපාත පිළිවෙලින් දක්වා ඇත්තේ කවරකද?
   i. ණය හිමිකම් අනුපාතය සහ ජංගම අනුපාතය
   ii. ක්ෂණික අනුපාතය සහ ණය පිරිවැටුම් අනුපාතය
   iii. මුළු වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය සහ ජංගම අනුපාතය
   iv. ණය අනුපාතය සහ වත්කම් පිරිවැටුම් අනුපාතය

15. ගිණුම්කරණ ක්‍රියාවලියේදී පහත දැ සිදුවන සාමාන්‍ය අනුපිළිවෙල කවරේද?
   A - අදාල මූලික පොතේ ගණුදෙනු වාර්ථාකිරීම
   B - ව්‍යාපාරික ගණුදෙනුව සිදුවීම
   C - ප්‍රභව ලියකියවිල්ල පිළියෙල කිරීම
   D - ගණුදෙනුව ලෙජරයට වාර්තා කිරීම
   E - ශේෂ පිරික්සුම පිළියෙල කිරීම

   i. C,B,D,A,E
   ii. B,C,A,D,E
   iii. B,A,C,D,E
   iv. B,C,D,A,E

16. ව්‍යාපාරයක බුන්වත් බව මැනීමට භාවිතා කල හැකි වඩාත් යෝග්‍ය ගිණුම්කරණ අනුපාත කවරේද?
   i. ණය අනුපාතය සහ පොලී ආවරණ අනුපාතය
   ii. ණය අනුපාතය සහ වත්කම් පිරිවැටුම් අනුපාතය
   iii. ණය අනුපාතය සහ හිමිකම් අනුපාතය
   iv. ණය අනුපාතය සහ ජංගම අනුපාතය

17. හාඩි ප්‍රයිවට් ලිමිටඩ් 2020 අප්‍රේල් 01 වන දින පිරිවැය රු. 500,000ක් වන යන්ත්‍රයක් මිලදී ගන්නා ලදි. යන්ත්‍රයේ අපේක්ෂිත ඵලදායි ජීවිත කාලය වර්ෂ 5ක් වන අතර ක්ෂය සරල මාර්ග ක්‍රමයට සිදුකරයි. යන්ත්‍රයේ සුන්බුන් වටිනාකම පිරිවැයෙන් 10%ක් වේ. ඒ අනුව, 2023 මාර්තු මස 31 වන විට සමුච්චිත ක්ෂය ගිණුමේ අගය කොපමණද?

   i. රු.90,000/-
   ii. රු.180,000/-
   iii. රු.270,000/-
   iv. රු.150,000/-

18. පහත සඳහන් තොරතුරු 2023 මාර්තු 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා සන් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයට අදාල වෙයි.

| | |
|---|---|
| 2022 මාර්තු 31 වන දිනට තොග | රු.350,000 |
| 2023 මාර්තු 31 වන දිනට තොග | රු.280,000 |
| වර්ෂය තුල කරන ලද ගැනුම් | රු.840,000 |
| වර්ෂය තුල උපයන ලද දළ ලාභය | 35% විකුණුම් වල ප්‍රතිශතයක් ලෙස |

සන් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයේ නිවැරදි විකුණුම් ආදායම කොපමණද?

i. රු.1,150,000/- ii. රු.1,400,000/-
iii. රු.1,750,000/- iv. රු.1,184,000/-

19. පහත සඳහන් තොරතුරු 2023 මාර්තු 31 වන දිනට, නැවුම් පළතුරු මිලදී ගැනීම, අලෙවිය සහ බෙදාහැරීම සිදුකරන ස්මාර්ට් ට්‍රේඩර්ස් ආයතනයේ අවසන් පොත් වලින් උපුටාගෙන තිබේ.

| | |
|---|---|
| විකුණුම් | රු.4,000 000 |
| විකුණු බඩුවල පිරිවැය | රු.2,200,000 |
| ආදායම් බදු සහ පොළිය අඩුකළ පසු වර්ෂයේ ලාභය (PAIT) | රු.800,000 |
| පොලී වියදම් | රු.60,000 |
| වර්ෂය සඳහා ආදායම් බදු | රු.40,000 |
| මූළු වත්කම් | රු.5,000,000 |

දළ ලාභ අනුපාතය සහ මුළු වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය වන්නේ;

| | දළ ලාභ අනුපාතය % | මුළු වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය % |
|---|---|---|
| i. | 55 | 18 |
| ii. | 45 | 16 |
| iii. | 55 | 16 |
| iv. | 50 | 18 |

20. වෙළඳාමේ නියුතු ව්‍යාපාර ආයතනයක වර්තමාන දළ ලාභ අනුපාතය 20%කි. පහත සඳහන් කවර අවස්ථාවක් හේතුවෙන් වර්තමාන දළ ලාභ අනුපාතය අඩුවේද?

i. විකුණුම් 50% කින් ඉහලයාම සහ විකුණුම් පිරිවැය 50% කින් ඉහල යාම
ii. විකුණුම් 50% කින් ඉහලයාම සහ විකුණුම් පිරිවැය 40% කින් ඉහලයාම
iii. විකුණුම් 50% කින් ඉහලයාම සහ විකුණුම් පිරිවැය 60% කින් ඉහලයාම
iv. විකුණුම් 40% කින් ඉහලයාම සහ විකුණුම් පිරිවැය 40% කින් ඉහලයාම

## බී (B) කොටස

(බී කොටසට මුළු ලකුණු 20ක් හිමිවේ. සෑම ප්‍රශ්නයකටම ලකුණු 04 බැගින් හිමිවේ)

පහත සඳහන් වත්කම් සහ වගකීම් විදුමිණි එන්ටර්ප්‍රයිසස් ව්‍යාපාරයේ ගිණුම් පොත්වලින් උපුටාගෙන තිබේ. 2022/04/01 සිට 2023/03/31 ගිණුම් වර්ෂය තුල මෙම ගිණුම් ව්‍යාපාරයේ හිමිකරු වන සේනාධීර මහතා විසින් සකස් කොට තිබේ.

| විස්තරය | 2022.04.01 දිනට වත්කම් සහ වගකීම් | 2023.03.31 දිනට වත්කම් සහ වගකීම් |
|---|---|---|
| ඉඩම් සහ ගොඩනැගිලි | 450,000 | 560,000 |
| යන්ත්‍ර සූත්‍ර | 310,000 | 470,000 |
| කාර්යාල උපකරණ | 190,000 | 260,000 |
| ආයෝජන | 100,000 | 150,000 |
| තොග | 90,000 | 60,000 |
| ණය ගැතියෝ | 45,000 | 67,000 |
| මුදල් සහ බැංකු ශේෂයන් | 15,000 | 19,000 |
| බැංකු ණය | 33,000 | 28,000 |
| ණය හිමියෝ | 14,000 | 11,000 |
| උපචිත වැටුප් | 10,000 | 13,000 |
| උපචිත වියදම් | 19,000 | 13,000 |
| වෙනත් වගකීම් | 14,000 | 8,000 |

පහත සඳහන් අතිරේක තොරතුරු ඔබට සපයා ඇත.

a. විදුමිණ ඒන්ටර්ප්‍රයිසිස් හි අයිතිකරු සේනාධීර මහතා 2022/2023 වසර තුල ව්‍යාපාරයට යෙදවූ අතිරේක ප්‍රාග්ධනය රු.80,000/-කි.

b. සේනාධීර මහතා 2022/2023 වසර තුල මුදලින් රු.50,000/- ක් සහ රු.60,000/- ක් වටිනා භාණ්ඩ තම පෞද්ගලික ප්‍රයෝජනයට ගෙන ඇත.

c. සියලුම වත්කම් ශුද්ධ පොත් අගයට වාර්ථා කොට ඇති බවට උපකල්පනය කරන්න.

ඉහත තොරතුරු භාවිතා කොට, ඔබ විසින් පහත දෑ ගණනය කරන්න.

I. 2023/03/31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය සඳහා ශුද්ධ ලාභය ගණනය කරන්න.

II. 2023/03/31 දිනට ව්‍යාපාරයේ ශුද්ධ වත්කම් ගණනය කරන්න.

III. 2023/03/31 දිනට ව්‍යාපාරයේ මුළු වත්කම් වල වටිනාකම ගණනය කරන්න.

IV. 2023/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා යෙදවූ මුළු වත්කම් වල ප්‍රතිලාභය ගණනය කරන්න.

V. 2023/03/31 දිනට ව්‍යාපාරයේ මූල්‍ය තොරතුරු ආශ්‍රයෙන් වත්කම් = හිමිකම් + වගකීම් යන ගිණුම්කරණ සමීකරණයේ වලංගුභාවය පෙන්වන්න.